**කුඩා තේ හා රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතිය - 2019**

කුඩා තේ හා රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ එහි කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන අන්තර්ජාතික අරමුදල අතර ඇතිකරගත් 2016 අප්‍රේල් 26 දිනැති අංක 2000001447 දරන මූල්‍ය ගිවිසුමෙහි **IX** ව්‍යවස්ථාවේ 9.03 (අ) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලසීමාව

මූල්‍ය ගිවිසුමට අනුව, වැවිලි කර්මාන්ත හා අපනයන කෘෂිකර්ම අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ප්‍රදේශය තුළ කුඩා තේ හා රබර් වතු හිමියන්ගේ ඵලදායී, ලාභදායී හා නම්‍යශීලී ආර්ථික කටයුතු තවත් වැඩි දියුණු කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ. මූල්‍ය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 8,502.08 කට සමාන ඇ.ඩො.මිලියන 65.40 ක් වූ අතර ඉන් රු. මිලියන 3349.28 කට සමාන ඇ.ඩො.මිලියන 25.76 ක් කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන අන්තර්ජාතික අරමුදල මගින් මූල්‍යයනය කිරීමට එකඟ වී ඇත. ඉතිරි ඇ.ඩො.මිලියන 39.63 ක මුදල ශ්‍රී ලංකා රජයේ, බැංකු (PFIs), ප්‍රතිලාභීන් හා පෞද්ගලික අංශය මගින් මූල්‍යයනය කිරීමට නියමිතය. ව්‍යාපෘතියෙහි කටයුතු 2016 අප්‍රේල් 26 වන දින ආරම්භකරන ලද අතර 2021 අප්‍රේල් 23 වන දින වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය ආරම්භ කිරීමේ මූලික කටයුතු වල ඇති වූ ප්‍රමාදය හේතුවෙන් එහි කටයුතු 2022 ජූනි 30 වන දින දක්වා දීර්ඝ කර ඇත.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 02 වගුවේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 තත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) හා කෘෂිකාර්මික සංවර්ධනය සඳහා අන්තර්ජාතික අරමුදලේ ව්‍යාපෘති විගණන මාර්ගෝපදේශ වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ව්‍යාපෘතිය ඇවර කිරීමට අදහස් කරන්නේ

නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ව්‍යාපෘතියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

ව්‍යාපෘතියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය හා අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

  මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම් ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-------------------------------------------

2.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

| ගිණුම්කරණ අඩුපාඩු | | බලපෑම් | කළමණාකාරීත්වයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | මුදල් ආපසු ලබාගැනීමේ අයදුම්පත් අනුව සමාලෝචිත වර්ෂය සඳහා සම්පූර්ණ වියදම රු.819,982,081 ක් විය. කෙසේ වෙතත්, එය මූල්‍ය ප්‍රකාශනවල රු.820,094,436 ක් ලෙස දෝෂ සහගත ලෙස දක්වා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, වර්ෂය සඳහා වියදම රු.112,355 ක් වැඩියෙන් දක්වා තිබුණි. | වියදම වැඩියෙන් දැක්වීම | එකඟයි.<br><br>ගිණුම් දෙක සැසඳීමෙන් පසු මෙම දෝෂය නිවැරදි කරනු ලැබේ. | මෙම දෝෂය නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | දෝෂ සහගත ගිණුම්කරණ ක්‍රියාමාර්ග හේතුවෙන්, 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දක්වා ඇති රජයේ දායකත්වය හා ජංගම නොවන වත්කම් රු.913,800 ක් අඩුවෙන් දක්වා තිබුණි. | රජයේ දායකත්වය හා ජංගම නොවන වත්කම් අඩුවෙන් දැක්වීම | එකඟයි. | දෝෂය නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

3. භෞතික ප්‍රගතිය

--------------------

3.1 ව්‍යාපෘතිය මගින් සිදු කරන ලද කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය

------------------------------------------------------------------------

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය, රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව සඳහා මූල්‍ය හා තාක්ෂණික සහාය ලබා දීමට හා මූල්‍ය ආයතන 4ක සහභාගීත්වයෙන් ක්‍රියාත්මක කරනු ලබන ණය යෝජනා ක්‍රමය තුළින් මූල්‍ය පහසුකම් සැපයීම යන සංරචක 03 කින්, ව්‍යාපෘතියේ කටයුතු සමන්විත විය. ඒ අනුව, නැවත වගා කිරීමේ කටයුතු සඳහා ගාල්ල, මාතර, රත්නපුර, බදුල්ල, නුවර හා නුවර එළිය යන දිස්ත්‍රික්ක වල කුඩා තේ වතු හිමියන්ට හා නව වගා කටයුතු සඳහා අම්පාර හා මොණරාගල දිස්ත්‍රික්කවල කුඩා රබර් වතු හිමියන්ට සහාය දැක්වීමට ව්‍යාපෘතිය මගින් සහනාධාර යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරනු ලබයි. ඉහත දක්වන ලද සංරචක 03 හි ප්‍රගතිය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| අංකය | විගණන නිරීක්ෂණ | බලපෑම | කළමණාකාරීත්වයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතියේ සැලසුම් සම්පූර්ණ කිරීමේ වාර්තාවට අනුව, 2016,2017, 2018 හා 2019 වර්ෂ වලදී තෝරාගත් දිස්ත්‍රික්ක 06 ක පවත්නා තේ වගාවන් ගලවා ඉවත් කිරීම මගින් හෙක්ටයාර 5,500 ක භූමි ප්‍රදේශයක් සකස් කිරීමට සැලසුම් කරන ලදී. කෙසේ වෙතත්, 2016 වර්ෂය තුළදී කිසිදු වැඩකටයුත්තක් ආරම්භකර නොතිබූ අතර 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා හෙක්ටයාර 1,452 ක භූමි ප්‍රමාණයක් පමණක් සකස් කර තිබුණි. ඒ අනුව, 2019 වර්ෂයේදී නැවත වගා කිරීමේ ඉලක්කය හෙක්ටයාර 4,500 දක්වා සංශෝධනය කිරීමට ව්‍යාපෘතිය විසින් තීරණය කර තිබුණි. එමෙන්ම, සැලසුම්කළ පරිදි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී සැලකිය යුතු ප්‍රමාදයක් නිරීක්ෂණය විය. | අපේක්ෂිත ප්‍රතිඵල අත්පත්කර ගැනීමට නොහැකිවී තිබුණි. | 2019 ජූනි මස කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන අන්තර්ජාතික අරමුදලේ මධ්‍ය කාලීන සමාලෝචනයෙහි නිර්දේශයන් මත පදනම්ව, තේ නැවත වගා කිරීමේ සම්පූර්ණ ඉලක්කය හෙක්ටයාර 4,500 දක්වා අඩු කර තිබුණි. මූලික සැලසුම් සමාලෝචනයේදී ඇති වූ සැලසුම් දෝෂයක් හේතුවෙන් ව්‍යාපෘතිය ආරම්භ කිරීමට සැලකිය යුතු ප්‍රමාදයක් ඇති වූ අතර, තාක්ෂණික සේවා සපයන්නාගෙන් (කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය) ලද දුර්වල තාක්ෂණික සහාය ආදිය | ව්‍යාපෘති කාලසීමාව තුළ සැලසුම්කරන ලද කටයුතු සිදුකිරීම කළයුතුය. |
| (ආ) | කුඩා තේ වතු සංවර්ධන අධිකාරියෙහි කොන්දේසියට අනුව, ඉඩම් සුද්ද කිරීම සඳහා පෙර | අපේක්ෂිත ප්‍රතිඵල අත්පත්කර ගැනීමට නොහැකි වී තිබුණි. | පෙර ගෙවීම් වලින් විශාල කොටසක් සිදුකර ඇත්තේ 2017 වර්ෂයේ අවසානයේදීය. | ව්‍යාපෘති ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | ගෙවීම සිදුකර වර්ෂ දෙකක් ඇතුළත තේ නැවත වගා කිරීම සිදුකළ යුතුය. කෙසේ වෙතත්, 2017 වර්ෂයේදී පෙර ගෙවීම කළ රු. මිලියන 138 කට අදාළ හෙක්ටයාර 1,037 ක භූමි ප්‍රමාණයෙන්, 2019 වර්ෂයේදී සියයට 58 ක් නියෝජනය කරමින් හෙක්ටයාර 610 ක් පමණක් වගා කර තිබුණි. | | ඒ අනුව විශාල කොටසක් ආරම්භකර ඇත්තේ 2018 මැයි සිට ජුනි කාල පරිච්ඡේදය තුළදීය. ඒ අනුව 2019 වර්ෂයේදී වගාකර ගැනීමට හැකිවූයේ හෙක්ටයාර 610 ක් පමණි. | |
| (ඇ) | ඉඩම් මැනීමේදී ඇති වූ ප්‍රමාදය, තණකොළ වැවීමේදී ඇති වූ ප්‍රමාදය, මෙම යෝජනා ක්‍රමයෙන් වගාකරුවන් ඉවත් වී තිබීම හා මාර්ගෝපදේශ වලට අනුකූල නොවීම වැනි විවිධ හේතූන් මත, සහනාධාර යෝජනා ක්‍රමය යටතේ, 2017 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාල සීමාව තුළ දිස්ත්‍රික්ක හයක හෙක්ටයාර 729.77 ක මුළු භූමි ප්‍රදේශයක තේ නැවත වගා කිරීමට බලපත්‍ර ලබාගත් ප්‍රතිලාභීන් 3,331 දෙනෙකු විසින් රු.109,263.440 ක පෙර ගෙවීම් ලබා ගැනීමෙන් පසු ඔවුන්ගේ සහනාධාර ගෙවීම් තවදුරටත් සිදුකර නොතිබුණි. | අපේක්ෂිත ප්‍රතිඵල අත්පත් කරගෙන නොතිබුණු අතර එය ඵලදායී නොවන වියදමක් විය. | එකඟයි. සියලු පෙර ගෙවීම් ලැබූවන්වූ (නැවත ගෙවීම් සිදු කළ පුද්ගලයන් හැර) කඩිනමින් නැවත වගා කිරීමේ ක්‍රියාවලියට ඇතුළත් කරගත හැකි බවට අපේක්ෂා කෙරේ. | ක්ෂේත්‍ර නිළධාරීන්ගේ කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. වගා කටයුතු සිදු කිරීම සඳහා වගාකරුවන් දැනුවත් කළ යුතුය. නැතහොත් පෙර ගෙවීම් නැවත අය කිරීමට ක්‍රියා කළ යුතුය. |
| (ඈ) | වාර්ෂික වැඩ සැලැස්ම හා 2019 වර්ෂය සඳහා වන අයවැයට අනුව, සේවා සැපයීමේ ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම, තම ව්‍යාපාරික කටයුතු ආරම්භ කිරීම හා හොඳම භාවිතයන් යොදාගැනීමට දිරිමත් කිරීම සඳහා, එක් තේ සමිතියකට රු.220,000 බැගින් වන මෙවලම් කට්ටල හා උපකරණ බෙදාහැරීමට ව්‍යාපෘතිය විසින් තේ සමිති | තම සේවා සැපයීමේ ක්‍රියාවලිය වැඩි දියුණු කිරීමට තේ සංගම් දිරිමත්කර නොතිබුණි. | නියමිත පරිදි, 2019 නොවැම්බර් මාසයේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භකර ඇති අතර 2020 පෙබරවාරි මාසය වන විට එය සම්පූර්ණකර තිබුණි. 2020 මාර්තු මාසය වන විට මෙවලම් හා උපකරණ තෝරාගත් සමිති වෙත බෙදාහැරීම අවසන් කිරීමට සැලසුම්කර තිබුණද, | සැලසුම් කළ ක්‍රියාකාරකම් ප්‍රමාදයකින් තොරව සැලසුම් කළ කාලසීමාව තුළ ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | 200 කින් සමිති 110 ක් තෝරාගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වන ප්‍රසම්පාදන සැලැස්මට අනුව, 2019 පෙබරවාරි මාසයේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් කළ යුතු වුවත්, එය සමාලෝචිත වර්ෂය අවසාන වන විට අවසන් කර නොතිබුණි. ඒ අනුව, තේ සමිති නගාසිටුවීමේ භෞතික ප්‍රගතියක් අත්පත්කර ගැනීමට ව්‍යාපෘතියට නොහැකි වී තිබුණි. | | කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන්, සැලසුම්කළ පරිදි ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් කිරීමට නොහැකි වී තිබුණි. | |
| (ඉ) | ව්‍යාපෘතියේ සැලසුම් සම්පූර්ණ කිරීමේ වාර්තාවට අනුව, 2016,2017,2018 හා 2019 වර්ෂයන්හිදී තෝරාගත් දිස්ත්‍රික්ක 02 ක හෙක්ටයාර 3,000 ක භූමි ප්‍රදේශයක රබර් වගා කිරීමට සැලසුම් කරන ලදී. සමාලෝචිත වර්ෂයේදී ව්‍යාපෘතිය විසින් හෙක්ටයාර 5,295 ක භූමි ප්‍රමාණයක් හඳුනාගෙන තිබුණි. කෙසේ වෙතත්, නව වගාවන් සඳහා වගාකිරීමේ බලපත්‍ර හෙක්ටයාර 2,575 ක භූමි ප්‍රමාණයක් සඳහා පමණක් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් නිකුත්කර ඇති අතර, මෙම යෝජනා ක්‍රමයෙන් වගා කරුවන් ඉවත්වී තිබීම හා වගාකරුවන් වෙනත් බෝග වගා කිරීම සඳහා යොමු වීම වැනි හේතූන් නිසා හෙක්ටයාර 2,094 ක භූමි ප්‍රමාණයක් පමණක් 2019 දෙසැම්බර් මාසය වනවිට වගාකර තිබුණි. ඒ අනුව, සැලසුම්කළ පරිදි ව්‍යාපෘතිය විසින් එහි ඉලක්කය මුළුමනින්ම අත්පත්කරගෙන නොතිබුණි. | අපේක්ෂිත ප්‍රතිඵල අත්පත් කරගෙන නොතිබුණි. | 2020 මහ කන්නයේදී ඉතිරි ඉලක්කය සපුරාගැනීමට අවශ්‍ය කටයුතු ව්‍යාපෘතිය විසින් දැනටමත් සැලසුම්කර ඇත. | ව්‍යාපෘති කාලසීමාව තුළ සැලසුම් කරන ලද කටයුතු සිදුකිරීම කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඊ) | 2019 සැප්තැම්බර් 15 සිට දෙසැම්බර් 15 දක්වා කාලය තුළ, ව්‍යාපෘතිය විසින් මොණරාගල හා අම්පාර දිස්ත්‍රක්කවල පිළිවෙලින් හෙක්ටයාර 1,014 හා හෙක්ටයාර 780 ක භූමි ප්‍රමාණයක රබර් පැළ වගා කිරීමට සැලසුම්කර තිබුණි. 2019 සැප්තැම්බර් මස සිට රබර් පැළ 925,704 ක් අදාළ භූමි ප්‍රදේශය වෙත ප්‍රවාහනය කිරීමට කටයුතු සිදුකර තිබුණද, මාසයක ප්‍රමාදයකින් පසු රබර් පැළ 621,725ක් පමණක් ප්‍රවාහනය කර තිබුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස සියයට 34 ක ඉතිරි ඉලක්කය සම්පූර්ණ කිරීමට ව්‍යාපෘතියට නොහැකි වී තිබුණි. | රබර් පැළ බෙදාහැරීමේදී ප්‍රමාදය, වගා කටයුතු නියමිත පරිදි කිරීමට නොහැකිවීම කෙරෙහි බලපෑ තිබුණි. | මෙම දිස්ත්‍රික්කවල, වගා කටයුතු සිදුකරන සමයේ ඉහළ වර්ෂාපතනයක් ලැබීමත් සමඟ වගා කටයුතු වලට දැඩි ලෙස බලපෑම් සිදු වූ අතර, 2019 වර්ෂයේදී, සැලසුම්කළ පරිදි සම්පූර්ණ ඉලක්කය අත්පත්කරගැනීමට නොහැකි වී තිබුණි. | මෝසම් වැසි සමය ආරම්භයත් සමඟ වගා කටයුතු සිදුකිරීම සඳහා සියලු ක්‍රියාකාරකම් සූදානම් කළ යුතුය. |
| (උ) | ව්‍යාපෘතිය විසින් 2019 වර්ෂයේ මහ කන්නයේදී මොනරාගල දිස්ත්‍රික්කයේ හෙක්ටයාර 572.4 ක භූමි ප්‍රදේශයක රබර් වගාකිරීමට සැලසුම්කර තිබූ අතර වගාකරුවන්ට කොම්පෝස්ට් පොහොර කිලෝ ග්‍රෑම් 886,075 ක සැපයීමට සැලසුම් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ. | | | |
| (i) | පැළ බෙදා හැරීම 2019 ඔක්තොබර් 12 වන දින ආරම්භ කර 2019 දෙසැම්බර් 15 වන දින අවසන්කර තිබුණද, පැළ බෙදාහැරීමේ කාල සීමාව තුළ කිසිදු ආකාරයකින් පොහොර බෙදා හැරීම සිදුකර නොතිබුණි. ඒ අනුව, පැළ සිටුවීමේදී පස් සමඟ | පොහොර මිශ්‍ර කිරීමෙන් තොරව පැළ වැඩීම ක්‍රමවත්ව සිදු නොවීම. | 2019 වර්ෂයේ මහ කන්නයේදී ඇති වූ දැඩි වර්ෂාව හේතුවෙන් වගාබිම් වලට පොහොර බෙදාහැරීම කෙරෙහි දැඩි බලපෑම් ඇති වී තිබුණි. | නියමිත කාල සීමාව තුළ සියලු ව්‍යාපෘති කටයුතු ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | පොහොර මිශ්‍ර කිරීම කළ නොහැකි වී තිබුණි. | | | |
| (ii) | හෙක්ටයාර 572.4 ක භූමි ප්‍රමාණයක් සඳහා කොම්පෝස්ට් පොහොර අවශ්‍යතාවය කිලෝ ග්‍රෑම් 886,075 ක් විය. කෙසේ වෙතත්, කොම්පෝස්ට් පොහොර කිලෝ ග්‍රෑම් 747,475 ක් පමණක් වගාකරුවන්ට සපයා තිබුණි. ඒ අනුව පැළ 46,200 ක් හෝ හෙක්ටයාර 89.5 ක භූමි ප්‍රදේශයක් සඳහා ඉතිරි කිලෝ ග්‍රෑම් 138,600 ක පොහොර සැපයීමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය විය. | පොහොර මිශ්‍ර කිරීමෙන් තොරව පැළ වැඩීම ක්‍රමවත්ව සිදු නොවීම. | වැසි සමය අවසන් වීමත් සමඟ, කොම්පෝස්ට් පොහොර සැපයීම සඳහා නැවත දිනයක් නියමකර වගාකරුවන්ට සැපයීම සිදු කරන ලදී. | නියමිත කාල සීමාව තුල වගාකරුවන්ට පොහොර ලබා දීම සිදුකළ යුතුය. |
| (ඌ) | ව්‍යාපෘතියෙහි සැලසුම් සම්පූර්ණ කිරීමේ වාර්තාවට අනුව, තේ දළු නෙළීමේ හා රබර් කිරි කැපීමේ කාල සීමාව දක්වා අහිමිවන ආදායම ආවරණය කර ගැනීමට ගොවීන්ට වාණිජ බැංකු හරහා ස්වයං රැකියාවල යෙදීම සඳහා හෝ කෙටි කාලීන ආදායම් උපයන මාර්ග ඇතිකර ගැනීමට, ණය පහසුකම් ලබා දීම වෙනුවෙන් රු. මිලියන 422.6 ක් වෙන්කර තිබුණි. කෙසේ වෙතත්, 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලය තුළ ණය පහසුකම් ලබාදීම ක්‍රියාත්මක කර නොතිබුණි. 2019 වර්ෂයේ වාර්ෂික වැඩ සැලැස්ම හා අයවැය ලේඛනය මගින් ගොවීන්ට රු. මිලියන 20 ක ණය පහසුකම් ලබාදීමට ව්‍යාපෘතිය විසින් සැලසුම්කර තිබුණද, එය 2019 දෙසැම්බර් 31 දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි. | ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීමට ගොවීන්ට දිරිමත් කර නොතිබුණි. | ව්‍යාපෘතියෙහි මූලික සංරචකයන් වන ග්‍රාමීය මූල්‍ය තත්ත්වය ආරම්භ කිරීමේ ප්‍රමාදයක් පැවතුණි. | සැලසුම් කරන ලද කටයුතු, ප්‍රමාදයකින තොරව සැලසුම්කරන ලද කාලසීමාව තුළ ක්‍රියාත්මක කළ යුතුය. |

2019 වර්ෂයේ වාර්ෂික වැඩ සැලැස්ම හා අයවැය ලේඛනය වගාකරුවන්ට රු. මිලියන 20 ක ණය පහසුකම් ලබාදීමට ව්‍යාපෘතිය විසින් සැලසුම්කර තිබුණද එය 2019 දෙසැම්බර් 31 දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි.

### 3.2 ව්‍යාපෘති අරමුණු වලින් පරිබාහිරව අරමුදල් උපයෝජනය කිරීම

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණකාරීත්වයේ ප්‍රතිචාර. | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| -------------------- | ------ | ----------------------- | ------------------- |
| දිස්ත්‍රික්ක 8 ක ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු සඳහා හා ව්‍යාපෘතියේ ප්‍රධාන කාර්යාලය සඳහා උපයෝජනය කිරීමට ව්‍යාපෘතිය විසින් 2018 සැප්තැම්බර් 04 වන දින ඩබල් කැබ් රථ 10 ක් මිලදීගෙන තිබුණි. එයින්, නුවරඑළිය දිස්ත්‍රික්කය සඳහා වෙන්කර තිබු ඩබල් කැබ් රථය වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය වෙත 2019 පෙබරවාරි 21 වන දින පැවරීමේ ප්‍රතිඵලයක් ලෙස, ව්‍යාපෘතිය විසින් නුවර එළිය දිස්ත්‍රික්කය තුළ භාවිතා කිරීම සඳහා වාහනයක් කුලී පදනම මත ලබාගෙන තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළදී රු. 1,126,870 ක් වාහන කුලී ගාස්තු වශයෙන් ගෙවා තිබුණි. | ව්‍යාපෘතියට අතිරේක පිරිවැයක් දැරීමට සිදුවීම. | ඉහත දක්වන ලද වාහනය, ව්‍යාපෘති කටයුතු සඳහා රේඛීය අමාත්‍යාංශය වෙතින් ලබා ගැනීමට මේ වන විටත් ක්‍රියාමාර්ග ගෙන ඇත. | ව්‍යාපෘතිය යටතේ වූ වත්කම් ව්‍යාපෘතියෙහි අරමුණු සඳහා උපයෝජනය කළ යුතුය. |

**3.3 මතභේදයට තුඩුදෙන කරුණු.**

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකාරිත්වයේ ප්‍රතිචාරය. | විගණකගේ නිර්දේශය. |
|---|---|---|---|
| වර්ෂයකට රබර් පැළ 250,000 ක් බැගින් සැපයීමේ ධාරිතාවයකින් යුතු, රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් අම්පාර දිස්ත්‍රික්කයෙහි පදියතලාවේ පිහිටි පැළ තවාන වැඩි දියුණු කිරීමට ව්‍යාපෘතිය විසින් 2018 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලය තුළ රු. මිලියන 42 ක් වැය කර තිබුණි. මේ මගින් වගාවන්ට අදාළ වැවක්, වාරිමාර්ග පද්ධතියක්, ආදර්ශ ගෙවත්තක්, අංකුර පැළ තවානක්, අංකුර කැපීමේ තවානක් හා මාර්ග පද්ධතියක් 2018 දෙසැම්බර් මස වන විට ඉදිකර අවසන් කිරීමට නියමිතව පැවතියද, එය වර්ෂයකට වඩා ප්‍රමාද වී තිබුණි. ඒ අනුව, සමාලෝචිත වර්ෂය තුළ අපේක්ෂිත පැළ ධාරිතාවය කරා ළඟා වීමට නොහැකි වී තිබුණි. | වර්ෂයකට රබර් පැළ 250,000 ක් බැගින් සැපයීමට නොහැකි වීම. | කුඩා තේ වතු හා රබර් වතු හිමියන් පුනර්ජීවනය කිරීමේ ව්‍යාපෘතියෙහි (STaRR Project) සහාය යටතේ පදියතලාව රබර් පැළ තවානෙහි ඉදිකිරීම් සඳහා ප්‍රසම්පාදන අස්ථිත්වය වන රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර ඇති තොරතුරු වලට අනුව වැවෙහි ඉදිකිරීම් සියයට 70 ක් අවසන් කර තිබුණි. | අවශ්‍ය රබර් පැළ නිෂ්පාදනය සපුරා ගැනීම සඳහා ඉදිකිරීම් වැඩ කඩිනම් කළ යුතුය. |

**3.4 මූල්‍ය පාලනය පිළිබඳ නිරීක්ෂණ.**

| අංකය | විගණන නිරීක්ෂණ | බලපෑම් | කළමනාකාරීත්වයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ. |
|---|---|---|---|---|
| (අ) | 2019 දෙසැම්බර් මාසයේදී රබර් පැළ මිලදී ගැනීමට හා ප්‍රවාහනයට රු. 2,015,806 ක් ව්‍යාපෘතියෙහි ගිණුම් පොත් වල සටහන් කිරීමෙන් තොරව ගෙවීම් කිරීම නිසා 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල මුදල් ශේෂය එම වටිනාකමින් වැඩියෙන්ද සමාලෝචිත වර්ෂය සඳහා මුළු | මුදල් ශේෂය වැඩියෙන් දක්වා තිබීම, වියදම අඩුවෙන් දක්වා තිබීම. | වර්ෂය අවසානයේ වැඩ කටයුතු අධික වීම හේතුවෙන් ඇති වූ ලිපිකාර දෝෂය නිසා මෙම කරුණ ඉස්මතු වී ඇත. මෙම දෝෂය දැනටමත් නිවැරදි කර ඇත. | සමාලෝචිත වර්ෂය තුළ දරන ලද සියලුම වියදම් ගිණුම්ගත කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | වියදම එම වටිනාකමින් අඩුවෙන්ද දක්වා තිබුණි. | | | |
| (ආ) | 2019 වර්ෂය සඳහා වන අයවැය ඇස්තමේන්තුව මගින් විදේශ සංරචකය හා රජයේ දායකත්වය යටතේ ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 1,120 ක් වෙන්කර තිබුණද, රු. මිලියන 1,301 ක (ප්‍රතිලාභීන් හා බැංකු දායකත්වය හැර) ව්‍යාපෘති කටයුතු සිදු කිරීම සඳහා 2019 වර්ෂයේ වාර්ෂික වැඩ සැලැස්මක් හා අයවැය ලේඛනයක් සකස් කර තිබුණි. ඒ අනුව, 2019 වර්ෂය සඳහා අරමුදල් සම්පාදනය සැලකිල්ලට ගනිමින් අයවැය ලේඛනය හා වාර්ෂික වැඩ සැලැස්ම ක්‍රමවත්ව පිළියෙල කර නොතිබුණි. | අයවැය ලේඛනයෙහි හා ක්‍රියාකාරී සැලැස්මෙහි ඉලක්ක අත්පත් කරගත නොහැකි වීම. | මූල්‍ය ගිවිසුමෙහි වගන්ති වලට අනුකූලව, වාර්ෂික වැඩ සැලැස්ම හා අයවැය ලේඛනය (AWPB) කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන අන්තර්ජාතික අරමුදලට ඉදිරිපත් කළ යුතු අතර, අදාළ මූල්‍ය වර්ෂයෙහි ආරම්භක දිනයට දින 60 කට පෙර විරෝධතා නොමැති බවට සහතිකයක් ලබා ගත යුතුය. ව්‍යාපෘතියෙහි වාර්ෂික වැඩ සැලැස්ම හා අයවැය ලේඛනය (AWPB) ප්‍රධාන වශයෙන් ව්‍යාපෘති සැලසුම් වාර්තාව (PDR) මත පදනම්ව ව්‍යාපෘති කාලසීමාව තුළ සිදු කිරීමට නියමිත ඉතිරි ක්‍රියාකාරකම් සැලකිල්ලට ගනිමින් පිළියෙල කරනු ලැබේ. සාමාන්‍යයෙන් ජාතික අයවැය ලේඛණය මගින් වෙන්කරනු ලබන ප්‍රතිපාදන (ශ්‍රී ලංකා රජය 11 කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන අන්තර්ජාතික අරමුදල - 12) තහවුරු කරනු ලබන්නේ අයවැය සම්මත වීමෙන් පසුව එළඹෙන ජනවාරි මාසයේදීය. අරමුදල් | අරමුදල් සම්පාදනය සළකා බලා වාර්ෂික වැඩ සැලැස්ම හා අයවැය ලේඛනය පිළියෙල කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | සම්පාදනය නොසලකා හරිමින් රු. මිලියන 1,302 ක් (රු. මිලියන 939.15 ක් කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන අන්තර්ජාතික අරමුදල සඳහා හා රු. මිලියන 362.71 ක් ශ්‍රී ලංකා රජය සඳහා) වාර්ෂික වැඩ සැලැස්ම හා අයවැය ලේඛනය (AWPB) පිළියෙල කර ඇති අතර, රු. මිලියන 1,120 ක් ද්‍රවශීලතා අවශ්‍යතාවය වෙනුවෙන් ලැබී තිබූ අතර, 2019.12.23 වන දිනෙන් පසු ව්‍යාපෘතිය සඳහා වන සම්පූර්ණ ප්‍රතිපාදනය වෙන් කර ඇති බව පැහැදිලිය. | |
| (ඇ) | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. | වංචා සහ වැරදි වැඩිවීමේ හැකියාව පැවතීම. | 2019 සැප්තැම්බර් මස සිට රේඛීය අමාත්‍යාංශයෙහි ප්‍රධාන අභ්‍යන්තර විගණනක තනතුර පුරප්පාඩුව පවතී. | ප්‍රමාදයකින් තොරව අභ්‍යන්තර විගණනයක් සිදු කළ යුතුය. |